මොරටුව මහා නගර සභාව

පුරප්පාඩු දැන්වීම

මොරටුව මහා නගර සභාවේ ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත

රියදුරන්ගේ සේවය ලබා ගැනීම

මොරටුව මහා නගර සභාව වෙත මාස 06ක කාලයක් සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත රියදුරු සේවාවන් (අත් ට්‍රැක්ටර් රථ සඳහා) ලබා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ ඉදිරිපත් කර ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඔබ විසින් සකස් කරන ලද අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි " ශ්‍රම මිලදී ගැනීම් - රියදුරු (අත් ට්‍රැක්ටර් රථ සඳහා)" ලෙස සඳහන් කර 2026.11.12 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (අදාළ අයදුම් පත්‍රය moratuwa.mc.gov.lkයන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක.)

1. තනතුර - අත් ට්‍රැක්ටර් රථ රියදුරු (ශ්‍රම මිලදී ගැනීමේ පදනම)
2. දීමනාව - වැඩ කරන එක් දිනක් සඳහා රු. 2600/- කි.
3. කායික සුදුසුකම් -
   I. අවම උස අඩි (5') විය යුතුය.
   II. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මඟින් ඒ බැව් සනාථ කළ යුතුය.
4. වෘත්තීය සුදුසුකම් -
   I. බරවාහන රියදුරු බලපත්‍රය ලබා තිබිය යුතුයි. (තාර බර හොණ්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මඟින් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම් 'ඒ1' සහ 'සී1' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' සහ''සී1' පන්තියේ බලපත්‍රයක් නැතහොත් තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රෙලර් සහ මඟින් 32ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ 'ඒ' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'සී'පන්තියේ බලපත්‍රයක්)
   II. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

5. පළපුරුද්ද -

අත් ට්‍රැක්ටර් රථ රියදුරකු ලෙස අවම වශයෙන් එක් වසරක (01) පළපුරුද්දක් තිබිය යුතුය.(පළපුරුද්ද විධිමත් සහතික මඟින් සනාථ කළ යුතුය.)

6. වෙනත් සුදුසුකම් -

I. 8 ශ්‍රේණිය සමත්ව තිබියයුතුය.

II. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට අවම වශයෙන් වසර 03ක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. (මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය තුල පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. ග්‍රාම නිලධාරි සහතිකයක් මඟින් පදිංචිය සනාථ කළ යුතුය.)

III. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

IV. අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතුයි.

7. බඳවා ගැනීමේ ක්‍රමය - සුදුසුකම්ලත් සේවකයින් පහත කොන්දේසිවලට යටත්ව සේවය සඳහා බඳවා ගනු ලැබේ.

I. වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයකින් පසු තෝරා ගැනීම සිදු කෙරේ.

II. දිනකට අවම පැය 09ක කාලයක් (දීවා / රාත්‍රී) සේවයේ යෙදිය යුතුය.

III. සේවා අවශ්‍යතාවය මත පමණක්සේවයට කැඳවනු ලැබේ.

IV. මසක් තුල ඔබ වැඩ කරන දින ගණන සඳහා අදාළ දීමනාව ඊළඟ මස පළමු සතිය තුල දී ගෙවීම් කරනු ලබයි.

V. සේවයේ අවශ්‍යතාවය මත සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දිනවල කැඳවීම් කරනු ලැබුවහොත්, සේවය කිරීමට ඔබ බැඳී සිටිය යුතුයි.

VI. මොරටුව මහා නගර සභාව විසින් නියම කරනු ලබනු ලැබුවහොත්, ඇප කොන්දේසි වලට යටත්ව රු. 25,000/-ක ඇපයක් තැබීමට ඔබ බැඳී සිටිය යුතුයි.

VII. තෝරා ගනු ලබන සියළුම අයදුම්කරුවන් මොරටුව මහා නගර සභාව සමඟ ගිවිසුමකට එළඹිය යුතුයි.

VIII. සම්මුඛ පරීක්ෂණයේ පදිංචියට අදාළ පොලිස් ස්ථානය විසින් නිකුත් කළ පොලිස් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

- අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන 2026.11.12 දිනට අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.
- අදාළ සේවා ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

නාගරික කොමසාරිස්,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.
2026.10.12

මොරටුව මහා නගර සභාවේ

රියදුරු (අත් ට්‍රැක්ටර් රථ සඳහා) තනතුර සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සේවයේ යෙදවීමේ

අයදුම් පත්‍රය

1. ජීව දත්ත තොරතුරු

1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : (උදා - සිල්වා ඒ.බී.සි.)

.....

1.2 සම්පූර්ණ නම

.....

.....

1.3 ස්ථිර ලිපිනය : .....

.....

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : .....

1.5 දුරකථන අංකය : .....

1.6 උපන් දිනය : වර්ෂය :..... මාසය ..... දිනය .....

1.7 2026.11.12 දිනට වයස : අවුරුදු ..... මාස ..... දින .....

1.8 බර වාහන රියදුරු බලපත්‍රයේ අංකය : .....

නිකුත් කළ දිනය : .....

රියදුරු බලපත්‍රය අවලංගු වන දිනය :.....

1.9 අධ්‍යාපන සුදුසුකම් :.....

.....

2. පළපුරුද්ද : .....

.....

(සැලකිය යුතුය - අයදුම්පත්‍රය සමඟ ජාතික හැඳුනුම්පතෙහි සහතික කල පිටපතක් සහ බර වාහන රියදුරු බලපත්‍රයේ සහතික කල පිටපතක් අමුණා එවිය යුතුය.)

අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවුත්, නිවැරදි වුත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම සේවය සඳහා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මා දනිමි.

.....

අයදුම්කරුගේ අත්සන

දිනය : .....

සැ.යු. :- නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, අදාළ සුදුසුකම් සනාථ කිරීමේ ලියවිලි අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.